# දෙමළ මාධ්‍ය විද්‍යාලයන්හි දෙවන දෙවන බසක් ලෙස සිංහල ඉගැන්වීම


ඩල්සි විමලා වින්ඩ්සර් (මිය)

අධ්‍යාපන පති පාඨමාලාව.
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය.
විද්‍යෝදය මණ්ඩපය.
ගංගොඩවිල - නුගේගොඩ.


1972 - 1974

122815

# පෙර වදන.

විධිමත් හෝ අවිධිමත් අධ්‍යාපනයක් තුළින් ලැබුවත් සිංහල දෙවන බසක් ලෙස ඉගෙනීම දීර්ඝ ඉතිහාසයක් ඇත්තකි. විවිධ විට දිවයිනෙහි පදිංචි වූ සුළු ජාතීන්, මහ ජාතියේ බස හැටියට සිංහලය ඉගෙනීමට පෙළඹුණේ විවිධ අභිමතාර්ථයන් ඇතිව ය. එහෙත් අන්තර් ජාතික භාෂාවක් ලෙසත්, සමාජ ආර්ථික ශ්‍රේෂ්ඨ නිසාත් ඉංග්‍රීසිය අනිවාර්ය දෙවන බසක් ලෙස ඉගෙනීමට බහු ජනතාව පෙළඹුණේ, විශේෂයෙන් 20 වැනි ශත වර්ෂයේ මැද භාගයේ සිට ස්වභාෂාව ඉගැන්වීමේ මාධ්‍යය වූ නිසා ය.

1956 සිට සිංහලයට ලැබුණු තැන නිසා ම, රජ බසේ වැඩ කරන බසක් හැටියට, සිංහලය ඉගෙනීමේ අවශ්‍යතාව සුළු ජාතීන්ට වඩ වඩා පැහැදිලි වන්නට විය. කල් යත් ම මේ තත්ත්වය වැඩි දියුණු වී අද සිංහල දෙවන බසක් ලෙස ඉගෙනීමට ඉදිරිපත් වී ඇති සංඛ්‍යාව, අවධානය යොමු විය යුතු තත්ත්වයට පත් ව ඇත. ඒ නිසා ම ය, 1972 දී ඇරඹුණු නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමග ම සිංහල දෙවන බසක් ලෙස ඉගැන්වීම ද වඩා සංවිධානාත්මක කිරීමට අධ්‍යාපනඥයින් ගේ සැලකිල්ල යොමු වූයේ.

1972 දී 6 වැනි ශ්‍රේණියෙන් ඇරඹුණු නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් හි දී විෂයමාලා සේවාස්ථ පුහුණු ආදී සිංහල දෙවන බස ඉගැන්වීම සම්බන්ධ ව ක්‍රියා කිරීමේ විවිධ කටයුතු සාර්ථක ව ඉටු කිරීමට අරභයා අධ්‍යාපන අමාත්‍යාංශයෙහි විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානයෙහි සිංහල දෙවන බස කමිටුවක් 1971 අග භාගයේ දී පිහිටුවන ලදී. මුල සිට ම (1972 ජනවාරියේ සිට ම) එම කමිටුවේ සාමාජිකාවක ලෙස සේවය කරන්නට මට ද අවස්ථාව ලැබුණි. ගුරු විශේෂ වසු වන ව්‍යාපාරීයක් හැටියට ආරම්භයේ දී ම සඳ සුළු අධ්‍යයනයක් උදෙසා මේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව මා අවධානය යොමු වූයේ කමිටු සාමාජිකාවක ලෙස ක්‍රියා කිරීම ඇරඹූ අවස්ථාවේ දී මයි.

මූලික අධ්‍යයනයකින් තොර ව, විවිධ අංශ පිළිබඳ සම්බන්ධතාවක් නැති ව, ලියවිලිවලට පමණක් සීමා වී කර ගෙන යන ව්‍යාපෘතීන් බොහෝ විට අසාර්ථක වන හෙයින්, ඒ අනුව රාජ්‍ය ආදායමෙනුත්, අධ්‍යාපන මුදල් ප්‍රතිපාදනයෙනුත් සැලකිය යුතු ප්‍රමාණයක් වියදම් වී අපතේ යන හෙයින් අපට රහසක් නො වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ 1972 දී ඇරඹුණු නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි එක් ක්ෂේත්‍රයක් සම්බන්ධ ව කටයුතු කරන්නට ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන, මගේ මව් බිමට ඉටු විය යුතු යුතුකමින් බිඳක් හෝ ඉටු කරන්නට අවස්ථාවක් ලබා ගැනීම ය, මේ අධ්‍යයනයේ පරමාර්ථය. ඒ සමග ම මේ අධ්‍යයනයේ ප්‍රතිඵලය, මා පෙනී සිටි අධ්‍යාපනපති පාඨ මාලාවේ අවශ්‍යතාවක් ලෙස සකස් කළ යුතු නිබන්ධය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ද කටයුතු කළෙමි.

අධ්‍යයන, නිබන්ධන, පර්යේෂණ වැනි කුමන කාර්යයක දී වුවත්, විභාග අවශ්‍යතාව ද පිරිමසමින්, දියුණු වෙමින් පවත්නා රටක් හැටියට අප රටේ අවශ්‍යතාවන්ට ප්‍රමුඛතාව දිය යුතු අවධිය උදා වී ඇති මේ කාලයේ අවබෝධ වී ඇත. ඒ නිසා සිංහල දෙවන බස ක්ෂේත්‍රයෙහි එක් අංශයක් ගැන පූර්ණ අධ්‍යයනයක් කිරීමට වඩා, මා සිත පෙළඹුණේ ආරම්භයේ දී ම ක්‍රමානුකූල වැඩ පිළිවෙළකට ප්‍රයෝජනවත් වන අන්දමේ නිගමනයන් හෙළි කරන, පොදු අධ්‍යයනයක් කිරීමයි. ඒ අනුව මා ගත් තැත බිඳකින් හෝ සාර්ථක වූයේ, විභාග ලක්ෂ්‍යයට අමතර ව, මෙම අධ්‍යයනයෙන් ලැබූ ප්‍රතිඵල සිංහල දෙවන බස වැඩ පිළිවෙළ සංවිධානයේ දී යම්තාක් හෝ ඉවහල් වෙතොත් පමණි.

තනි පුද්ගලයකු ලෙස, සීමිත සම්පත් තුළින් කරන ලද මේ අධ්‍යයනයේ දී, විශ්වවිද්‍යාල සංවර්ධන මධ්‍යස්ථානයේ සේවය කරමින්, මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වීමට ලැබුණු අවස්ථාව වැදගත් මට විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ඒ සමග ම මේ කාර්යය සපුරා ලීමට මට අත දුන්, දිරි දුන් සැමට ද නො මඳ ව පින් දෙමි.

# පටුන


පිටු අංක

ස්තුතිය i
පෙර වදන ii

නිබන්ධයේ වැඩ සීමාව ... ... ... ... ... 1
සිංහල දෙවන බසක් ලෙස උගෙනීමේ ඉතිහාසය ... ... ... 3
සිංහල දෙවන බසක් ලෙස ඉගෙනීම/උගැන්වීම පිළිබඳ අධ්‍යයනය:
1.00 අධ්‍යයනයේ වැදගත්කම ... ... ... ... 9
2.00 අධ්‍යයනයේ සීමාව ... ... ... ... ... 11
3.00 අධ්‍යයනයේ අභිමතාර්ථ ... ... ... ... 14
4.00 අධ්‍යයනයට තුඩු දුන් හේතු ... ... ... ... 15
5.00 අධ්‍යයනයේ සැලැස්ම හා එය ක්‍රියාත්මක කළ ආකාරය ... 17
6.00 සාරාංශය ... ... ... ... ... 21
7.00 රැස් කොට ගත් දත්තයන් මත කෙරෙන සමාලෝචනය: ... ...
7.10 සිංහල දෙවන බස ඉගැන්වෙන විද්‍යාල හා ශිෂ්‍යයන් ... 24
7.20 සිංහල දෙවන බස ඉගැන්වීමේ යෙදී සිටින ගුරුවරුන් ... 29
7.30 පෙළ පොත්, අතිරේක කියවීම්, ගුරු අත් පොත්, පාඨ මාලා ආදිය 37
7.40 දීප ව්‍යාප්ත ශිෂ්‍ය සාධන මට්ටම ... ... ... 39
7.50 විද්‍යාල නිරීක්ෂණයෙන් හෙළි වූ දෑ ... ... 43
7.60 ගුරු ප්‍රශ්න මාලා දත්තයන් අනුව හෙළි වන කරුණු ... 46
7.70 දත්තයන් ප්‍රක්‍රියනයේ දී විදුහල්පති/පතිනි හා ගුරුවර/ගුරුවරියන් විසින් පවසන ලද අදහස් මත කෙරෙන ප්‍රකාශන හා යෝජනා 63
7.80 පුද්ගල පුහුණුව ... ... ... ... 66
7.90 දෙමාපිය අදහස් අභිරුචිය හා ආකල්ප ... ... 69

අධ්‍යයනයේ පසු පෙවුම අනුව කෙරෙන යෝජනා සහ හුදුරු අනාගතයේ දී අධ්‍යයන, විමර්ශන, පර්යේෂණ ආදී කටයුතු වෙනුවෙන් අවධානය යොමු විය යුතු මාතෘකා 76
භාෂා කිහිපයක් විෂය මාලාවට ඇතුලත් කර ඇති අන් රටවල් ගැන:-
සෝවියට් රුසියාව ... ... ... ... 87
අමෙරිකා එක්සත් ජනපදය ... ... ... ... 91
ඕස්ට්‍රේලියාව ... ... ... ... ... 95
ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජය ... ... 96
එංගලන්තය ... ... ... ... ... 98
ජපානය ... ... ... ... 99
ඉන්දියාව ... ... ... ... ... 100
පිලිපීනය ... ... ... ... ... 103
චීන සමූහාණ්ඩුව ... ... ... ... 104
සිංගප්පූරුව ... ... ... ... 105
මලයාසියාව ... ... ... ... ... 106
ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යාපනය ... ... 109
පාඨ මාලාව ... ... ... ... ... 113

උපග්‍රන්ථය
5.10 සිං. දෙ. බස ඉගැන්වෙන විද්‍යාල දැන ගැනීම සඳහා යැවූ ලිපිය 208
5.20 එම විදුහල් පිළිබඳ දත්තයන් සපයා ගැනීම සඳහා යැවූ ලිපිය 210
එම ලිපියේ දෙමළ පරිවර්තනය ... ... 216
5.30 "අ" 6 ශ්‍රේණියේ සාධන පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය ... 221
"ආ" පිරිවිතර වගුව. ... ... 225
"ඉ" සාධන පරීක්ෂණය පැවැත්වීමේ උපදෙස් මණ්ඩල මට්ටමෙන් 226
එහි දෙමළ පරිවර්තනය ... 233
"ඊ" සාධන පරීක්ෂණය පැවැත්වීමේ උපදෙස් විදුහල් මට්ටම 230
එහි දෙමළ පරිවර්තනය ... ... ... 333
"උ" සමීක්ෂණය කරන ලද විද්‍යාල ... ... 237
"ඌ" විද්‍යාලයන් නිරීක්ෂණය කිරීමේ නිර්යාණ ... 239
5.40 'අ' ගුරු ප්‍රශ්න මාලා පිළිබඳව විදුහල්පතිට යැවූ ලිපිය ... 242
"ආ" ගුරුවරුනට යැවූ ලිපිය .. ... ... 243
"ඉ" ගුරු ප්‍රශ්න මාලාව ... ... ... ... 244
5.50 දෙමාපිය සම්බන්ධ පරීක්ෂණ ප්‍රශ්න මාලාව ... ... 254
එහි දෙමළ පරිවර්තනය ... ... ... 257
6.10 සාධන පරීක්ෂණ ශිෂ්‍ය සාම්පලය ... ... ... 261
7.10 සිං. දෙ. බස උගැන්වෙන විද්‍යාල ... ... ...
මුස්ලිම් - නගරබද ... ... ... ... 266
,, ගම්බද ... ... ... ... ... 267
දෙමල - නගරබද ... ... ... ... 268
,, ගම්බද ... ... ... ... 299
සිංහල මාධ්‍ය විද්‍යාලයන්හි දෙමළ අංශ - නගරබද ... 270
,, ,, ,, ,, ,, - ගම්බද ... ... 271
ආශ්‍රිත ග්‍රන්ථ ... ... ... ... ... 272
සටහන් .. ... ... ... ... ... 280